දිනමිණ
The Dinamina

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor@dinamina.lk
දැන්වීම් කළමනාකරු - 2429321

වර්ෂ 2016 ක්වූ මාර්තු මස 12 වැනිදා සෙනසුරාදා

# අධිකරණයේ යහපාලනය

රටක සංවර්ධනය හා ස්ථාවරත්වය සටහන් කරන සාධක අතර නීතියේ ආධිපත්‍යය ද පවතී. නීතියේ ආධිපත්‍යය නොපවතින රාජ්‍යයක් ලෝක ප්‍රජාවගේ සැලැකිල්ලට ලක්වන්නේ නැත. ශ්‍රී ලංකාව ද 2005 පමණ සිට නීතියේ ආධිපත්‍යය ගැන හොඳ සැලැකිල්ලක් දක්වා නැති බව එකල වූ සිදුවීම්වලින් පැහැදිලි වෙයි. අධිකරණයට සිදුවූ දේශපාලන බලපෑම්, නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා පත්කර ඇති පොලීසියට සිදු වූ දේශපාලන බලපෑම් පමණක් නොව; නීති සම්පාදනයේදී පාර්ලිමේන්තුව තුළ සිදු වූ අයුක්ති සහගත කරුණු ද මීට සාධක ලෙස දැක්විය හැකිය.

2015 සිදු වූ දේශපාලන පෙරළියට බලපෑ ප්‍රධාන සාධකයක් ලෙසද මෙය සැලැකිය හැකිය. පැවැති ඒකාධිපති ආණ්ඩුව තමන්ට රිසි ලෙස නීතිය හසුරුවා ගැනීමට සමත් විය. එහි පාඩුව හා අයුක්තිය හොඳින් දැනුණේ සාමාන්‍ය ජනතාවට ය. ඒ අනුව නීතියේ ආධිපත්‍යය පිහිටුවන දේශපාලන ව්‍යාපෘතියකට සහාය දක්වන තැනක ජනතාව පසුවූහ. වත්මන් ආණ්ඩුව බලයට පත්කළ ජනතාව මේ ආණ්ඩුව වෙතින් නීතියේ ආධිපත්‍යය ප්‍රධාන වශයෙන් අපේක්ෂා කළහ. එම අපේක්ෂාව අදත් එලෙසම පවතී.

මේ ආණ්ඩුව නීතියේ ආධිපත්‍යය පිහිටුවීම සඳහා සත්‍යය ලෙසම ක්‍රියාකරන්නේද? එසේ ක්‍රියා කරන්නේ නම්; දේශපාලනයේ බලපෑම්වලින් අධිකරණය නිදහස් විය යුතුය. එබඳු නිදහස්වීමක් අද දකින්නට ලැබේ. නිදසුනක් කිවහොත් ජනාධිපතිවරයා තමන්ගේම අභිමතය මත පමණක් අග්‍රවිනිශ්වයකාරයා හෝ නීතිපතිවරයා හෝ පත්කර නැත. එම තනතුරු දෙකම පත්කර ඇත්තේ සාධාරණ හා යුක්ති සහගත ක්‍රමයකට බව පෙනී යයි. එම පත්වීම් සම්බන්ධයෙන් විරෝධයක් ඇත්තේ ද නැත. අපට හැඟෙන පරිදි නීතියේ ආධිපත්‍යය පිහිටුවීමට අදාළ මූලික කොන්දේසියක් ලෙස එය සැලැකිය හැකි ය.

තවත් සිදුවීම් ගණනාවක් මේ සම්බන්ධයෙන් උපුටා දැක්විය හැකි ය. බැසිල් රාජපක්ෂ මහතා මීට පෙර ක්‍රියා කළේ රාජපක්ෂ පරම්පරාවට රටේ ඕනෑ ම දෙයක් කළ හැකිය යන තත්ත්වයේ සිටය. සැබැවටම එවැනි දෙයක් සමාජය තුළ ස්ථාපනය කර තිබිණි. එහෙත් අද වනවිට ඔහුට එරෙහිව අධි චෝදනා ගොනු කර තිබේ. බැසිල්ට එරෙහි නඩු විභාගය මේ මස 22 ද සිට විභාගයට ගැනීමට නියමිත ය. ඔහුට ඇති එක් චෝදනාවක් වන්නේ මහජන මුදලින් රුපියල් කෝටි තුනකට අධික මුදලක් මහින්ද රාජපක්ෂ මහතාගේ නමින් නිකුත් කරන ලිත් වගයක් සඳහා වියදම් කර ඇති බවය. මෙය ජාතික අපරාධයෙකි. මීට අදාළ පරීක්ෂණ කඩිනම් කළ යුතුව තිබේ.

අදාළ ව එම මිනිය නැවත ගොඩගෙන පරීක්ෂණ කළ යුතු යැයි අධිකරණය තීන්දු කර තිබේ. ලබන 15 දට ඇඹිලිපිටිය පොදු කනත්තේදී එම ශරීරය ගොඩගෙන නැවත පරීක්ෂණ සිදු වේ. අපට පෙනෙන හැටියට නම්; එය සාධනීය ලක්ෂණයෙකි. මේ ගැන රටේ ම අවධානය යොමු විය යුතුව ඇතැ'යි සැලැකිය හැකිය. යෝෂිත රාජපක්ෂ මහතාගේ නඩු විභාගය ද මීට සමානය. ඔහුට එරෙහි ප්‍රමාණවත් සාක්ෂි තිබේ. අනෙක් අතට ඔහුට සම්බන්ධ නාලිකාවේ ඇතැම් ලිපි ලේඛන අදටත් මකා දමමින් සිටිති. මේ තත්ත්වය යටතේ යෝෂිත මහතාට ඇප ලබා දෙන්නේ කෙසේ ද? එසේ ඇප ලබා දුනහොත් එය රටේ පවත්නා නීතියට කරන අවමානයක් ලෙස ද සැලැකිය හැකිය.

දේශපාලකයන්ට හා දේශපාලන බලවතුන්ට සම්බන්ධ ඇතැම් පිරිස්වලට රජගෙදර පරෙවියන් සේ හැසිරීමට ඉඩක් දෙන්නේ නම්; එතැන නීතියක් ක්‍රියාත්මක වන්නේ යැයි සිතිය නොහැකිය. නීතියක් පමණක් නොව; එහි සදාචාරයක් ද නැත. මේවා ඉතා සිහි නුවණින් යුතුව කල්පනාවට ගත යුතු යැයි අපට සිතේ. රටේ දේශපාලන නායකයන් දූෂණ හා වංචාවලට සම්බන්ධ නම්; තරාතිරම නොබලා ඔවුන් අත්අඩංගුවට ගත යුතුය. එසේ නොවුණහොත් අපට ඉදිරි ගමනක් නැත. දැන් නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් අලුත් ප්‍රවේශයක් ගොඩනැගී තිබේ. එහි එක් අර්ථයක් වන්නේ චූදිතයගේ තරාතිරම නොබලා වරදක් ඇතොත් අත්අඩංගුවට ගැනීම ය. එය එසේම සිදුවිය යුතුය.

රජයේ ප්‍රබල අමාත්‍යවරයකු වන චම්පික රණවක මහතාට මේ දිනවල ප්‍රධාන චෝදනාවක් එල්ල වී තිබේ. එම චෝදනාවලට මුහුණ දෙන ඔහු කියා ඇත්තේ තමන් නිර්දෝෂ වන බව හා ඇතැම් ජනමාධ්‍ය සිද්ධිය අතිශයෝක්තියෙන් වරනගා ඇති බවය. එය එසේ වන්නටත් පුළුවන. නොවන්නටත් පුළුවන. කුමක් වුව රජයේ ස්ථාවරය වන්නේ අමාත්‍යවරයා වරදක් සිදු කර ඇත්නම් ඔහු වහා ම අත්අඩංගුවට ගත යුතු බවය. එබඳු ක්‍රියාවලියක් දැන් ක්‍රියාත්මක වේ. එක අතෙකින් පොලිසියේ පරීක්ෂණ සිදු වේ. රණවක මහතාගෙන් ප්‍රකාශයක් ලබාගැනීමටද අධිකරණය අවසර දී තිබේ. තවත් අතෙකින් තත්ත්වය ගැන සොයා බැලීමට ස්වේච්ඡා සංවිධාන ද එකතු වී සිටිති. එයද හොඳ සාධනීය තත්ත්වයකි.

නීතිය හරි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණය පමණක් නොව; වෙනත් ආයතන ද සක්‍රිය ලෙස දායක විය යුතුය. එලෙස ස්වාධීන ලෙස ක්‍රියාත්මක විය යුතු එක් ආයතනයක් වන්නේ පොලීසියයි. මේ වනවිට ශ්‍රී ලංකාවේ පොලීසිය දේශපාලන හස්තයෙන් මුළුමනින්ම නිදහස් යැයි සිතන්නට පුළුවන. තවදුරටත් දේශපාලකයා ගොස් පොලිස් ලොක්කාගේ ආසනයෙහි අසුන් ගන්නේ නැත. අනෙක් අතට ස්වේච්ඡා සංවිධාන හා මානවහිමිකම් සංවිධාන ද නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට ක්‍රියා කළ යුතුය. පසුගියදා කිසියම් තරුණ කණ්ඩායමක් උකුස්සකු පණ පිටින් හම ගසා ඌ අන්තර්ජාලය මගින් ප්‍රකාශයට පත්කරන ලදී. මේ ම්ලේච්ඡ පිරිසට උපරිම දඬුවම් දිය යුතු යැයි රජයේ පාර්ශ්වයක් ම බලවත් සේ කියා සිටිති.

නීතියේ ආධිපත්‍යය පිහිටුවීම ඉබේ සිදුවන්නේ නැත. ඒ සඳහා මනුෂ්‍ය ප්‍රජාව කැප වීම් කළ යුතුය. වෙනත් වචනයකින් කිවහොත් නීතියේ යහපාලනය සඳහා පළමුව ක්‍රියාකළ යුත්තෝ ජනතාව ය.